# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1894/26 - 2014 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා - 2014.12.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1631/20 දරන හා 2009.12.09 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය සහ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට වරින් වර කරන ලද සංශෝධනයන් අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට අගතියක් නොවන පරිදි පහත දැක්වෙන ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ආදේශ කරනු ලැබේ."

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**ටී. එම්. එල්. සී. සේනාරත්න**<br>
ලේකම්<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2014 දෙසැම්බර් මස 23 වැනි දින,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දී.

01. ***ක්‍රියාත්මක වන දිනය***

මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2009 ජූලි 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

02. ***පත් කිරීම් බලධරයා***

| | | | |
|---|---|---|---|
| 2.1 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III, II, I ශ්‍රේණි | - | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් |
| 2.2 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II, I ශ්‍රේණි | - | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් |
| 2.3 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III, II, I ශ්‍රේණි | - | රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

03. *සේවා ගණය/සේවා ගණ*

(අ) කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ 3

(ආ) ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරී බණ්ඩ 1

(ඇ) විධායක

04. *පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය*

රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා දායකවීමේ ප්‍රධානතම සේවය වශයෙන් එම කාර්යයන් සඳහා සහය වන අභ්‍යන්තර හා බාහිර ආයතන සමග මනා සම්බන්ධතාවයක් හා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් හා තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා ප්‍රයෝජනයට ගනිමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවයෙන් අපේක්ෂා කරන්නාවූ අරමුණු වෙත ළඟාවීම පිණිස විශිෂ්ඨ රාජ්‍ය සේවයක් ගොඩනැංවීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදාගැනීම, මෙහෙයවීම හා ඊට අදාල සේවාවන් සැපයීම ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ කාර්යභාරය වන්නේය.

*සටහන :*

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විශේෂඥතා ක්ෂේත්‍ර අනුව කාර්යභාරය සම්බන්ධ වර්ගීකරණය 1 වැනි උපලේඛණයෙහි දැක්වේ.

05. *වැටුප්*

5.1 වැටුප් කේත අංක :

| | | |
|---|---|---|
| කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ 3 | - | MT 01 - 2006 - A |
| ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරී බණ්ඩ 1 | - | MN 06 - 2006 - A |
| විධායක | - | SL 01 - 2006 |

5.2 වැටුප් පරිමාණය :

3 පන්තිය III, II හා I ශ්‍රේණි (MT 01 - 2006 - A)
රු.14,425-10x145-11x170-6x240-14x320-රු. 23,665

2 පන්තිය II හා I ශ්‍රේණි (MN 06-2006 - A)
රු.17,680 - 10 x 320 - 11 x 365 - 15 x 450 - රු.31,645

1 පන්තිය III, II හා I ශ්‍රේණි (SL 01 - 2006)
රු.22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු.53,555

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර හා වැටුප් කේත අංකය | ආරම්භක වැටුප් තලය |
|---|---|---|
| 3 පන්තිය III ශ්‍රේණිය | MT 01 - 2006 - A පියවර 01 | රු. 14,425 |
| 3 පන්තිය II ශ්‍රේණිය | MT 01 - 2006 - A පියවර 12 | රු. 16,045 |
| 3 පන්තිය I ශ්‍රේණිය | MT 01 - 2006 - A පියවර 23 | රු. 17,985 |
| 2 පන්තිය II ශ්‍රේණිය | MN 06 - 2006 - A පියවර 01 | රු. 17,680 |
| 2 පන්තිය I ශ්‍රේණිය | MN 06 - 2006 - A පියවර 12 | රු. 21,245 |
| 1 පන්තිය III ශ්‍රේණිය | SL 01 - 2006 - A පියවර 01 | රු. 22,935 |
| 1 පන්තිය II ශ්‍රේණිය | SL 01 - 2006 - A පියවර 12 | රු. 30,175 |
| 1 පන්තිය I ශ්‍රේණිය | SL 01 - 2006 - A පියවර 20 | රු. 36,755 |

**06.** *සේවයට අයත් තනතුරු*

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| *අනුමත තනතුරු නාම* | *තනතුර අනුමත ශ්‍රේණිය* | *අනුමත තනතුරු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 3 පන්තිය III/II/I ශ්‍රේණි | 1394 | 1 වැනි උපලේඛනයේ දැක්වේ |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | 2 පන්තිය II/I ශ්‍රේණි | 262 | |
| සහකාර අධ්‍යක්ෂ | 1 පන්තිය III ශ්‍රේණිය | 57 | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | 1 පන්තිය II/III ශ්‍රේණි | 12 | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 1 පන්තිය II ශ්‍රේණිය | 10 | |
| අධ්‍යක්ෂ | 1 පන්තිය I ශ්‍රේණිය | 06 | |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| | | |
|---|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | - | 1394 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | - | 262 |
| සහකාර අධ්‍යක්ෂ | - | 57 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | - | 12 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | - | 10 |
| අධ්‍යක්ෂ | - | 06 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා 3 වන පන්තියේ III, II හා I ශ්‍රේණි ද, 2 පන්තියේ II හා I ශ්‍රේණි ද, 1 පන්තියේ III, II හා I ශ්‍රේණි ද ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

6.3 තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

**07.** *බඳවා ගැනීමේ ක්‍රමය*

7.1 බඳවා ගන්නා අනුපාතය :

| *පන්තිය හා ශ්‍රේණිය* | *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|---|
| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණිය | විවෘත | 100% |
| | සීමිත | - |
| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණිය | විවෘත | 70% |
| | සීමිත | 30% |
| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණිය | විවෘත | 70% |
| | සීමිත | 30% |

සටහන :

සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ හා 1 පන්තියේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවාගැනීම සඳහා සුදුසුකම් ලබන්නන්ගේ සංඛ්‍යාව පුරප්පාඩුවලින් 30% කට වඩා අඩු නම් එම ප්‍රමාණය විවෘත තරඟ විභාගයේ සුදුසුකම් ලැබූ අයගෙන් පුරවනු ලැබේ.

**7.2 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියට බඳවා ගැනීම**

7.2.1 **විවෘත බඳවා ගැනීම :**

7.2.1.1 බඳවා ගන්නා ශ්‍රේණිය : 3 පන්තියේ III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළු සම්මාන පහක් (05) සහිතව විෂයයන් හයකින් (06) එක්වර සමත්වීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමේ හෝ ඊට ඉහල පරිගණක / තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් හදාරා තිබීම.

7.2.2.3 පළපුරුද්ද : අදාල නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාව තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ) සේවයට පත් කිරීම සඳහා වන තරඟ විභාග වලට පෙනී සිටීම සඳහා අවම සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 7.2.2.1, 7.2.2.2 හා 7.2.3 සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනයේ සඳහන් අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18 යි

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35 යි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 100 | 40 |
| 2. අභියෝග්‍යතාව | 100 | 40 |

(විෂය නිර්දේශය 3 වන උපලේඛණයෙහි දක්වා ඇත.)

7.2.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා දෙනු නොලැබේ.

7.2.4.4.1 ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : සුදුසුකම් පරීක්ෂා කිරීම.

7.2.4.4.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම මගින් හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.3 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියට බඳවා ගැනීම**

7.3.1 **විවෘත බඳවා ගැනීම :**

7.3.1.1 බඳවා ගන්නා ශ්‍රේණිය : 2 පන්තියේ II ශ්‍රේණිය

7.3.1.2 සුදුසුකම් :

7.3.1.2.1 අධ්‍යාපන සුදුසුකම් :

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

හෝ

(2) i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් සහිත උපාධියක් ලබා තිබීම. (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය.)

සහ

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

හෝ

(3) i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම.

සහ

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

හෝ

(4) i. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (07) මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා තිබීම.

සහ

ii. අදාල ක්ෂේත්‍රයේ වසර දෙකක (02) වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

7.3.1.2.2 වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ.

7.3.1.2.3 පළපුරුද්ද : අදාල නොවේ.

7.3.1.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාව තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.1.2.5 වෙනත් :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ) සේවයට පත් කිරීම සඳහා වන තරඟ විභාග වලට පෙනී සිටීම සඳහා අවම සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 7.3.1.2.1 හා 7.3.1.3 හි සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනයේ සඳහන් අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

7.3.1.3 වයස :

7.3.1.3.1 අවම සීමාව : අවුරුදු 21 යි
7.3.1.3.2 උපරිම සීමාව : අවුරුදු 35 යි

7.3.1.4 බඳවා ගැනීමේ ක්‍රමය :
7.3.1.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 100 | 40 |
| 2. අභියෝග්‍යතාව | 100 | 40 |
| 3. සාමාන්‍ය බුද්ධිය | 100 | 40 |

(විෂය නිර්දේශය 4 වන උපලේඛනයෙහි දක්වා ඇත.)

7.3.1.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.
7.3.1.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.
7.3.1.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.
7.3.1.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා දෙනු නොලැබේ.
7.3.1.4.4.1 ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : සුදුසුකම් පරීක්ෂා කිරීම.
7.3.1.4.4.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයාඃ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

7.3.1.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.3.2 සීමිත බඳවා ගැනීම :**

7.3.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : 2 පන්තියේ II ශ්‍රේණිය
7.3.2.2 සුදුසුකම් :
7.3.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාල නොවේ.
7.3.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ.
7.3.2.2.3 පළපුරුද්ද :

(අ) (i) 3 පන්තියේ I ශ්‍රේණියේ වසර හතරක (04) සේවා කාලයක් සමඟ පූර්වාසන්න වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.
සහ
(ii) 3 පන්තියේ I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.
හෝ
(ආ) (i) 3 පන්තියේ II ශ්‍රේණියේ නිලධරයෙකු වීම හා පූර්වාසන්න වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම.
සහ
(ii) මෙම සේවා ව්‍යවස්ථාවේ 7.3.1.2.1 හි අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

7.3.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාව තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුයි.

7.3.2.2.5 වෙනත් :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(ඇ) සේවයට පත් කිරීම සඳහා වන තරඟ විභාග වලට පෙනී සිටීම සඳහා අවම සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 7.3.2.2.3 හි සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනයේ සඳහන් අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

7.3.2.3 වයස : අදාළ නොවේ
7.3.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.3.2.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අභියෝග්‍යතාව | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සිද්ධි අධ්‍යයනය | 100 | 40 |

(විෂය නිර්දේශය 5 වන උපලේඛනයෙහි දක්වා ඇත.)

7.3.2.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.
7.3.2.4.2වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.
7.3.2.4.3ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.
7.3.2.4.4සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා දෙනු නොලැබේ.

7.3.2.4.4.1 ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : සුදුසුකම් පරීක්ෂා කිරීම
7.3.2.4.4.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

7.3.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.4 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියට බඳවා ගැනීම**

**7.4.1 විවෘත බඳවා ගැනීම :**

7.4.1.1 බඳවා ගන්නා ශ්‍රේණිය : 1 පන්තියේ III ශ්‍රේණිය
7.4.1.2 සුදුසුකම් :
7.4.1.2.1 අධ්‍යාපන සුදුසුකම් :

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය/ පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ පරිගණක තාක්ෂණයට අදාල උපාධියක් ලබා තිබීම.
හෝ
(2) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම (මෙහිදී සම්පූර්ණ උපාධි පාඨමාලාවෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය.)
සහ
(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.
හෝ

(3) (i) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (07) මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා තිබීම.
සහ
(ii) අදාල ක්ෂේත්‍රයේ වසර දෙකක (02) වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

7.4.1.2.2 වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ.
7.4.1.2.3 පළපුරුද්ද : අදාල නොවේ.
7.4.1.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාව තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
7.4.1.2.5 වෙනත් :

(අ) ශ්‍රී ලාංකාවේ පුරවැසියෙක් විය යුතුය.
(ආ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(ඇ) සේවයට පත් කිරීම සඳහා වන තරග විභාග වලට පෙනී සිටීම සඳහා අවම සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 7.4.1.2.1 හා 7.4.1.3 හි සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනයේ සඳහන් අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

7.4.1.3 වයස :
7.4.1.3.1 අවම සීමාව : අවුරුදු 21 යි
7.4.1.3.2 උපරිම සීමාව : අවුරුදු 35 යි

7.4.1.4 බඳවා ගැනීමේ ක්‍රමය :
7.4.1.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවබෝධය | 100 | 40 |
| 3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව | 100 | 40 |

(විෂය නිර්දේශය 6 වන උපලේඛනයෙහි දක්වා ඇත.)

7.4.1.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.
7.4.1.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.
7.4.1.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.
7.4.1.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා දෙනු නොලැබේ.

7.4.1.4.4.1 ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : සුදුසුකම් පරීක්ෂා කිරීම
7.4.1.4.4.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.1.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.4.2 සීමිත බඳවා ගැනීම :**
7.4.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : 1 පන්තියේ III ශ්‍රේණිය
7.4.2.2 සුදුසුකම් :
7.4.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාල නොවේ.
7.4.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ.
7.4.2.2.3 පළපුරුද්ද :

(1) (අ) 2 පන්තියේ I ශ්‍රේණියේ නිලධරයෙකු වීම හා පූර්වාසන්න වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.
සහ
(ආ) එම ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.
හෝ
(2) (අ) 2 පන්තියේ II ශ්‍රේණියේ නිලධරයෙකු වීම හා පූර්වාසන්න වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.
සහ
(ආ) 7.4.1.2.1 හි සඳහන් සුදුසුකම් සපුරා තිබීම.
සහ
(ඇ) එම ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

7.4.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාව තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.4.2.2.5 වෙනත් :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(ඇ) සේවයට පත් කිරීම සඳහා වන තරග විභාග වලට පෙනී සිටීම සඳහා අවම සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 7.4.2.2.3 හි සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනයේ සඳහන් අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

7.4.2.3 වයස : අදාළ නොවේ

7.4.2.4 බඳවා ගැනීමේ ක්‍රමය:

7.4.2.4.1 ලිඛිත විභාගය :

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව | 100 | 40 |

(විෂය නිර්දේශය 7 වන උපලේඛනයෙහි දක්වා ඇත.)

7.4.2.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

7.4.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.4.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.4.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා දෙනු නොලැබේ.

7.4.2.4.4.1 ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : සුදුසුකම් පරීක්ෂා කිරීම

7.4.2.4.4.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**08. කාර්යක්ෂමතා කඩඉම්**

8.1

| *කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද යන වග* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| **3 පන්තිය** | | |
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | 3 පන්තියේ III ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් (03) ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි (08 වන උපලේඛණය ) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | 3 පන්තියේ II ශ්‍රේණියට උසස්වී වසර තුනක් (03) ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි (09 වන උපලේඛණය) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | 3 පන්තියේ I ශ්‍රේණියට උසස්වී වසර පහක් (05) ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්ෂණයකි (10 වන උපලේඛණය) |
| **2 පන්තිය** | | |
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | 2 පන්තියේ II ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් (03) ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි (11 වන උපලේඛණය) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | 2 පන්තියේ I ශ්‍රේණියට උසස්වී වසර පහක් (05) ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි (12 වන උපලේඛණය) |
| **1 පන්තිය** | | |
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | 1 පන්තියේ III ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් (03) ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි (13 වන උපලේඛණය) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | 1 පන්තියේ II ශ්‍රේණියට උසස්වී වසර තුනක් (03) ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි (14 වන උපලේඛණය ) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | 1 පන්තියේ I ශ්‍රේණියට උසස්වී වසර පහක් (05) ගතවීමට පෙර | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති වාර්තාව (15 වන උපලේඛණය) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද යන වගː විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්කිරීම්/ පරිපාලන බලධරයා විසින් අනුමත කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක්/ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලැබේ.

**09. භාෂා ප්‍රවීණතාවය**

9.1

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| 03. සන්ධාන භාෂාව | 2 පන්තියේ II ශ්‍රේණියට හා 1 පන්තියේ III ශ්‍රේණියට බඳවාගන්නා නිලධාරීන් බඳවාගෙන වසර තුන (03) ක් තුළ අ.පො.ස. (සා.පෙළ) සම්මාන සාමාර්ථයක් ලබා ගත යුතුය. |

10. **ශ්‍රේණි උසස් කිරීම්**

10.1 **3 පන්තියේ III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම**

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

(i) පත්වීම ස්ථිර කර තිබීම.
(ii) සේවා ගණයේ 3 පන්තියේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.
(iii) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
(iv) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.
(vi) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් 3 පන්තියේ II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 3 පන්තියේ II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 **3 පන්තියේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම**

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

(i) සේවා ගණයේ 3 පන්තියේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.
(ii) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
(iii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් 3 පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 3 පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3 **2 පන්තියේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම**

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

(i) පත්වීම ස්ථිර කර තිබීම.
(ii) සේවා ගණයේ 2 පන්තියේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.
(iii) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
(iv) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.
(vi) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් 2 පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරික්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2 පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**10.4 1 පන්තියේ III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම**

10.4.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව

10.4.1.1 සපුරාලිය යුතු සුදුසුකම් ඃ

(i) පත්වීම ස්ථිර කර තිබීම.
(ii) සේවා ගණයේ 1 පන්තියේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.
(iii) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
(iv) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.
(vi) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.4.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් 1 පන්තියේ II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරික්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1 පන්තියේ II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**10.5 1 පන්තියේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම**

10.5.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව

10.5.1.1 සපුරාලිය යුතු සුදුසුකම් ඃ

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය/ පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ පරිගණක තාක්ෂණයට අදාළ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
(ii) සේවා ගණයේ 1 පන්තියේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හතක (07) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හතක් (07) උපයාගෙන තිබීම.
(iii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
(iv) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර හතක් (07) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
(v) අදාල කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.5.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් 1 පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරික්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1 පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සටහන ඃ සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම් සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. **තනතුරුවලට පත් කිරීම**

11.1

| තනතුර | සුදුසුකම් | තෝරාගනු ලබන ආකාරය |
|---|---|---|
| 1 පන්තියේ I ශ්‍රේණියේ තනතුරු | 1 පන්තියේ I ශ්‍රේණියේ නිලධරයෙකු වීම. | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අවස්ථාවෝචිතව අනුමත කරන ලද පටිපාටියක් (ක්‍රමවේදයක්) මගින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තනතුරුවලට පත්කරනු ඇත. |
| 1 පන්තියේ II ශ්‍රේණියේ තනතුරු | 1 පන්තියේ I හෝ II ශ්‍රේණියේ නිලධරයෙකු වීම | |
| 1 පන්තියේ III ශ්‍රේණියේ තනතුරු | 1 පන්තියේ I හෝ II හෝ III ශ්‍රේණියේ නිලධරයෙකු වීම. | |

(ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයෙහි 1 පන්තියට අයත් වන තනතුරු 2 වන උපලේඛනයෙහි දැක්වේ.)

11.2 සේවයේ 2 හා 3 පන්තිවල සේවා අවශ්‍යතාවය, ජ්‍යෙෂ්ඨත්වය, පළපුරුද්ද පදනම් කර ගෙන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තනතුරුවල රාජකාරි පවරා දෙනු ඇත.

11.3 උසස්වීම් සිදු කරනු ලබන්නේ ඒකාබද්ධ තනතුරු ප්‍රමාණය මත පදනම්ව වන බැවින් එම ශ්‍රේණියේම තනතුරක රාජකාරි පැවරීමට නොහැකි අවස්ථාවලදී ආසන්න ශ්‍රේණියට අයත් තනතුරක රාජකාරියේ යෙදවීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය ඇත.

12. **සේවයට අදාළ කොන්දේසි**

12.1 පුහුණුව හා සංවර්ධනය

12.1.1 සේවාරම්භක පුහුණුව

සේවයට බඳවාගත් සෑම නිලධරයෙකුම පත්කිරීම් බලධරයාගේ අනුමැතිය හා සංවිධානය මත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් හෝ පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන වෙනත් පුහුණු ආයතනයක් විසින් පවත්වනු ලබන සති දෙකක (02) සේවාරම්භක පුහුණුව සම්පූර්ණ කල යුතුය. මෙම පුහුණුව පත්වීම ලැබූ දිනයේ සිටම ආරම්භ කළ යුතුය.

12.1.2 සේවාස්ථ පුහුණුව

සේවාස්ථ පුහුණුව මගින් නිලධාරියෙකු හට වෘත්තීයමය නිපුණතාවය වර්ධනය කර ගැනීමේ අවස්ථාව අඛණ්ඩව ලබා දෙනු ඇත. සේවයේ පන්ති 3ට අදාල වගකීම් හා ඒවායේ වෘත්තීය අභිවෘද්ධිය ඇති කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ. නිලධරයා සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ/ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් හෝ පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන වෙනත් පුහුණු ආයතනයක් විසින් එක් එක් පන්තිය වෙනුවෙන් වාර්ෂිකව සංවිධානය කරන පැය හතලිහකට (40) නොඅඩු සේවාස්ථ පුහුණු පාඨමාලාව සම්පූර්ණ කල යුතුය.

13. **අර්ථ නිරූපණ හා නිර්වචන**

13.1 **"ව්‍යවස්ථා සංග්‍රහය"** යන පදයෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය වේ.

13.2 **"පරිපාලන බලධරයා"** යනු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වේ.

13.3 **"සේවාව"** යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාව වේ.

13.4 **"සතුටුදායක සේවා කාලය"** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති සංග්‍රහය අනුව අර්ථකථනය වේ.

13.5 **"සක්‍රීය සේවා කාලය"** යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම**

14.1 අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ 2011.02.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2011, 2012.08.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2011(i) සහ 2014.08.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2011(ii) චක්‍රලේඛවල විධිවිධාන පරිදි සේවයට අන්තර්ග්‍රහණය කරනු ඇත.

**15. අන්තර් කාලීන විධිවිධාන**

15.1 පූර්ව තනතුරේ බඳවාගැනීම් පටිපාටියේ කාර්යක්ෂමතා කඩඉම් සඳහන්ව නොමැති විට හෝ පත්වීම් ලිපියේ කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳ සඳහන් නොවීම මත කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කර නොමැති නිලධාරීන් සිටිනම් අදාල පන්තියේ නියමිත ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම මෙම සේවා ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළ වූ දින සිට වසර තුනක (03) සහන කාලයක් තුල දී සම්පූර්ණ කළ යුතුය.

15.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කර ඇති 2007.07.01 දින හෝ එදිනට පසුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාල තනතුරකට පත්වීම් ලැබූ නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි සඳහන් පරිදි අනෙක් රාජ්‍ය භාෂාවේ නියමිත ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

15.3 ඉහත 14 වගන්තියෙහි දක්වා ඇති චක්‍රලේඛයන්හි ඇති විධිවිධාන යටතේ සේවයට අන්තර්ග්‍රහණය වන නිලධාරීන් ඔවුන්ගේ පූර්ව සේවා කාලය ද සැලකිල්ලට ගෙන මෙම සේවා ව්‍යවස්ථාවේ 10 වගන්තියේ සඳහන් ශ්‍රේණි උසස්වීම් අනුව ඒ ඒ ශ්‍රේණිය සඳහා උසස්වීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරන දිනට ඊළග ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

**16. ස්ථාන මාරු**

සේවයේ නිලධරයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වාර්ෂික ස්ථාන මාරු පරිපාටියකට අනුකූලව සිදු කෙරෙන ස්ථාන මාරුවලට යටත් වේ. ඔවුන් දිවයිනේ කවර හෝ ප්‍රදේශයකට ස්ථානමාරු කිරීම සේවයේ අවශ්‍යතාවය මත පත්කිරීම් බලධරයාට සිදුකළ හැකිය.

**17. වෙනත් කරුණු**

17.1 මෙම ව්‍යවස්ථා සංග්‍රහය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට බඳවාගනු ලබන හෝ අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන් විෂයයෙහි බලපැවැත්විය යුතුය. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාවට අයත් වන තනතුරු හා ඒවා ශ්‍රේණිගත කිරීම 2 උපලේඛනයේ දක්වා ඇති ආකාරයට විය යුතුය.

17.2 සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති දැක්වෙන අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

17.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ රජය විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා / හෝ රෙගුලාසිවලට මෙම නිලධාරීන් යටත් වනු ඇත.

17.4 මෙම සේවා ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17.5 මෙම සේවා ව්‍යවස්ථාවෙහි සිංහල, දෙමළ, ඉංග්‍රීසි පිටපත් වල කරුණු අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල පිටපත බලාත්මක වේ.

17.6 මෙම සංශෝධිත ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව සඳහා අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/14/1317/523/027 හා 2014.10.31 දිනැති ලිපියෙන් දුන් 2014.10.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය නිශ්කාෂණයක් ලබා ගන්නා ලදි.

## 1 වැනි උපලේඛනය

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 4, 6 ඡේද බලන්න)

1.1 විශේෂඥතා ක්ෂේත්‍රය අනුව කාර්යභාරය

| *විශේෂඥතා ක්ෂේත්‍රය* | *විශේෂඥතා ක්ෂේත්‍රය අනුව කාර්යභාරය* |
|---|---|
| තොරතුරු පද්ධති (IS) | 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සැලසුම් කෙටුම්පත් කිරීම.<br>2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම.<br>3. ආයතනික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් හඳුනා ගැනීම (Requirement Analysis/System Analysis) හා තොරතුරු තාක්ෂණික විසඳුම් නිර්මාණයට අදාල මූලික කටයුතු සිදු කිරීම - (System Designing).<br>4. ක්ෂේත්‍රයට අදාල තාක්ෂණික ඇගයීම් කටයුතු සිදු කිරීම.<br>5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම/ ඇගයීම.<br>6. කළමනාකරණ අවශ්‍යතා සඳහා තොරතුරු පද්ධති වාර්තා (MIS Reports ) සැකසීම.<br>7. විශේෂඥතා ක්ෂේත්‍රයට අදාල කටයුතු වෙනුවෙන් අභ්‍යන්තර/ බාහිර ආයතන සමඟ සම්බන්ධතාවයන් පවත්වා ගැනීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම. |
| තොරතුරු තාක්ෂණ (IT) | 1. හඳුනාගත් අවශ්‍යතා සඳහා මෘදුකාංග නිර්මාණය, පරීක්ෂණය, ස්ථාපනය සහ නඩත්තු කටයුතු කිරීම. (Programming, Development, Testing, Implimentation and Maintanance).<br>2. දත්ත සමුදාය නිර්මාණය, පරිපාලනය හා නඩත්තු කටයුතු කිරීම (Database Administration).<br>3. නිල වෙබ් අඩවි නිර්මාණය කිරීම, යාවත්කාලීන කිරීම, පවත්වාගෙන යාම සම්බන්ධ කටයුතු සිදු කිරීම සහ ඊට අදාල ප්‍රධාන රාජකාරී ඉටු කිරීම.<br>4. පරිශීලක අවශ්‍යතාවන්ට ගැලපෙන අයුරින් මෘදුකාංග යාවත්කාලීන කිරීම.<br>5. මෘදුකාංග, දත්ත සුරක්ෂිතභාව උදෙසා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම.<br>6. විශේෂඥතා ක්ෂේත්‍රයට අදාල කටයුතු වෙනුවෙන් අභ්‍යන්තර/ බාහිර ආයතන සමඟ සම්බන්ධතාවයන් පවත්වා ගැනීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම. |
| පරිගණක ජාල / ආරක්ෂණය (Computer Networks/ Security) | 1. පරිගණක ජාල නිර්මාණය කිරීම, ජාල පරිපාලනය සහ ඒවායේ නඩත්තු කටයුතු සිදු කිරීම (Network/ Administration).<br>2. පරිගණක දෘඩාංග / ජාල දෘඩාංගයන්හි නඩත්තු කටයුතු, දෝෂ අනාවරණය සහ ඒවා නිරාකරණයට අවශ්‍ය කටයුතු කිරීම.<br>3. අන්තර්ජාල/ විද්‍යුත් තැපැල් පහසුකම් සම්බන්ධ පරිපාලන කටයුතු සිදු කිරීම.<br>4. පරිගණක ජාල, තොරතුරු පද්ධති ආරක්ෂණය සම්බන්ධ කටයුතු කිරීම සහ ඒ හා සම්බන්ධ ප්‍රධාන රාජකාරි ඉටු කිරීම (Network Security Administration)<br>5. විශේෂඥතා ක්ෂේත්‍රයට අදාල කටයුතු වෙනුවෙන් අභ්‍යන්තර/ බාහිර ආයතන සමඟ සම්බන්ධතාවයන් පවත්වා ගැනීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම. |

1.2 තනතුරු අනුව විශේෂඥතා ක්ෂේත්‍රයන්හි කාර්යභාරයන් වර්ගීකරණය

| *තනතුරු නාම* | *තනතුරේ කාර්යභාරය* |
|---|---|
| අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ | විශේෂඥතා ක්ෂේත්‍රයන්හි අදාල කාර්යභාරයන් වර්ගීකරණයක් සහිතව හෝ රහිතව ක්‍රියාත්මක කිරීම/ ඒ සඳහා ඉහල මට්ටමේ දායකත්වයක් ලබා දීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සේවයේ 2 පන්තියේ/ 3 පන්තියේ නිලධාරීන් මෙහෙයවීම. |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | විශේෂඥතා ක්ෂේත්‍රයන්හි අදාල කාර්යභාරයන් වර්ගීකරණයක් සහිතව හෝ රහිතව ක්‍රියාත්මක කිරීම. |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | විශේෂඥතා ක්ෂේත්‍රයන්හි අදාල කාර්යභාරයන් වර්ගීකරණයක් සහිතව හෝ රහිතව ක්‍රියාත්මක කිරීම සඳහා සහායක කාර්යයන් ඉටුකිරීම. |

සටහන:

(i) ආයතනයේ අවශ්‍යතාව මත ඉහත සියළු විශේෂඥතා ක්ෂේත්‍රයන්හි කාර්යයන් හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අයත් වෙනත් කාර්යයන් වර්ගීකරණයකින් තොරව එක් නිලධාරියකු සඳහා පන්තිය අනුව රාජකාරි කාර්යයන් පැවරීම සිදු කළ හැකි අතර ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීම නිලධාරියාගේ වර්තමාන ආයතන ප්‍රධානියාට සිදුකල හැකි වේ.

## 2 වැනි උපලේඛනය

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට ඇතුළත් වන තනතුරු නාම ලේඛනය

1 පන්තියේ තනතුරු

(අ) 1 පන්තියේ I ශ්‍රේණියේ තනතුරු

| තනතුරු නාමය | තනතුර අයත් ආයතනය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ) | ජනාධිපති කාර්යාලය | 01 |
| | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | 01 |
| | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 02 |
| | දේශීය අදායම් දෙපාර්තමේන්තුව | 01 |
| | මැතිවරණ දෙපාර්තමේන්තුව | 01 |

(ආ) 1 පන්තියේ II ශ්‍රේණියේ තනතුරු

| තනතුරු නාමය | තනතුර අයත් ආයතනය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | ජනාධිපති කාර්යාලය | 01 |
| | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | 01 |
| | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 01 |
| | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 06 |
| | සෞඛ්‍ය අමාත්‍යාංශය | 01 |

(ඇ) 1 පන්තියේ II / III ශ්‍රේණියේ තනතුරු

| තනතුරු නාමය | තනතුර අයත් ආයතනය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 06 |
| | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 01 |
| | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 01 |
| | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 01 |
| | සෞඛ්‍ය අමාත්‍යාංශය - වෛද්‍ය සැපයීම් අංශය | 03 |

(ඈ) 1 පන්තියේ III ශ්‍රේණියේ තනතුරු

| *තනතුරු නාමය* | *තනතුර අයත් ආයතනය* | *තනතුරු සංඛ්‍යාව* |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | ජනාධිපති කාර්යාලය | 02 |
| | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | 01 |
| | අධ්‍යාපන අමාත්‍යාංශය | 01 |
| | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 01 |
| | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | 03 |
| | සෞඛ්‍ය අමාත්‍යාංශය | 03 |
| | වසංගත රෝග විද්‍යා අංශය | 01 |
| | පවුල් සෞඛ්‍ය කාර්යාංශය | 01 |
| | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 02 |
| | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 01 |
| | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 01 |
| | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 02 |
| | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 02 |
| | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 02 |
| | මැතිවරණ දෙපාර්තමේන්තුව | 02 |
| | රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 01 |
| | විදේශ කටයුතු අමාත්‍යාංශය | 01 |
| | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 01 |
| | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 01 |
| | කම්කරු දෙපාර්තමේන්තුව | 01 |
| | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 01 |
| | තැපැල් දෙපාර්තමේන්තුව | 02 |
| | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 01 |
| | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 14 |
| | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 01 |
| | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 03 |
| | වාණිජ දෙපාර්තමේන්තුව | 01 |
| | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | 03 |
| | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 01 |

## 3 වැනි උපලේඛනය

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7.2 බලන්න)

1. විභාගයේ නම:
   ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියට බඳවාගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය

2. විභාගය පිළිබඳ විස්තරඃ සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | පැය 02 | 100 | 40 |
| 2. අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40 |

*සටහනඃ*

සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරඟ විභාගයක් වුවද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් 40% වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් අපැහැදිළි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

3. විභාගය පවත්වන බලධරයාඃ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.
4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි
5. විභාගය සඳහා විෂය නිර්දේශයඃ

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | විභාග අපේක්ෂකයාගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳව සාමාන්‍ය දැනුම, මෙහෙයුම් පද්ධතීන්, මෘදුකාංග, (වදන් සැකසුම, පැතුරුම්පත්, ඉදිරිපත් කිරීම්, දත්ත සමුදාය කළමනාකරණය ඇතුලුව) දෘඩාංග, අන්තර්ජාලය සහ ඉලෙක්ට්‍රොනික තැපැල ආදී ක්ෂේත්‍ර වලින් තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ව්‍යුහගත හා බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 2. අභියෝග්‍යතාව | විභාග අපේක්ෂකයාගේ සංඛ්‍යා ලේඛනාත්මක හැකියාව, තර්කානුකූල කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

6. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.

## 4 වැනි උපලේඛනය

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7.3.1 බලන්න)

1. විභාගයේ නමඃ
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවාගැනීම සඳහා පවත්වන විවෘත තරඟ විභාගය
2. විභාගය පිළිබඳ විස්තරඃ සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | පැය 02 | 100 | 40 |
| 2. අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40 |
| 3. සාමාන්‍ය බුද්ධිය | පැය 01 | 100 | 40 |

*සටහනඃ*

සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරඟ විභාගයක් වුවද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් 40% වත්

අපේක්ෂකයා විසින් ලබාගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් අපැහැදිළි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

3. විභාගය පවත්වන බලධරයා: විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.
4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි
5. විභාගය සඳහා විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | විභාග අපේක්ෂකයාගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මූලධර්ම, පරිගණක නිර්මිතිය හා මෙහෙයුම් පද්ධති, මෘදුකාංග (වදන් සැකසුම, පැතුරුම්පත්, ඉදිරිපත් කිරීම්, දත්ත සමුදාය කළමනාකරණය සහ කාර්යාලවල භාවිතා වන වෙනත් මෘදුකාංග පැකේජ) දෘඪාංග, දත්ත සන්නිවේදනය හා පරිගණක ජාල, අන්තර්ජාලය, වෙබ් අඩවි නිර්මාණ සහ නව අන්තර්ජාල සේවාවන්, ඉලෙක්ට්‍රොනික තැපැල, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ජීවන චක්‍රය ආදී ක්ෂේත්‍ර වලින් දැනුම හා අධීක්ෂණ හැකියාව පරීක්ෂා කරනු ලබන ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. |
| 2. අභියෝග්‍යතාව | විභාග අපේක්ෂකයාගේ සංඛ්‍යා ලේඛනාත්මක හැකියාව සහ තර්කානුකූල කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පනහකින් (50) සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 3. සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කරගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

6. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.

## 5 වැනි උපලේඛනය

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7.3.2 ඡේදය බලන්න)

1. විභාගයේ නම:
   ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවාගැනීම සඳහා පවත්වන සීමිත තරඟ විභාගය
2. විභාගය පිළිබඳ විස්තර: සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සිද්ධි අධ්‍යයනය | පැය 02 | 100 | 40 |

සටහන:
සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරඟ විභාගයක් වුවද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් 40% වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් අපැහැදිළි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

3. විභාගය පවත්වන බලධරයා: විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.
4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි
5. විභාගය සඳහා විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. අභියෝග්‍යතාව | විභාග අපේක්ෂකයාගේ සංඛ්‍යා ලේඛනාත්මක හැකියාව සහ තර්කානුකූල කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පනහකින් (50) සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සිද්ධි අධ්‍යයනය | රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළව ඇතිවිය හැකි ගැටලු එකක් හෝ කිහිපයක් සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/ සිද්ධීන් අපේක්ෂකයාට යොමු කර අපේක්ෂකයා සතු නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසි වලට අදාළව රාජ්‍ය සේවයේ පරිචය ආශ්‍රයෙන් මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |

6. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.

## 6 වැනි උපලේඛනය

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7.4.1 ඡේදය බලන්න)

1. විභාගයේ නම:
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියට බඳවාගැනීම සඳහා පවත්වන විවෘත තරඟ විභාගය
2. විභාගය පිළිබඳ විස්තර: සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | පැය 1 | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවබෝධය | පැය 2 | 100 | 40 |
| 3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව | පැය 2 | 100 | 40 |

සටහන:
සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරඟ විභාගයක් වුවද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් 40% වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් අපැහැදිළි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

3. විභාගය පවත්වන බලධරයා: විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.
4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි
5. විභාගය සඳහා විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කරගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවබෝධය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණයේ පරිකල්පන හැකියාවන්, තොරතුරු තාක්ෂණ ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව, තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කළමනාකරණ හැකියාව සහ දෙන ලද මාතෘකාවන්/ තේමාවන් සඳහා පද්ධති විශ්ලේෂණය, සැලසුම්කරණය හා මෘදුකාංග පද්ධති හා වර්ධනය පිළිබඳ අපේක්ෂකයාගේ ශක්තිය මෙහි දී පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නව ප්‍රවණතා සහිතව මෘදුකාංග සංවර්ධනය, ස්ථාපනය හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් වන දැනුම යොදා ගනිමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අයදුම්කරුගේ අභියෝග්‍යතාව මැනීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

6. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැලකිල්ල යොමු කළ යුතුය.

## 7 වැනි උපලේඛනය

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 7.4.2 ඡේදය බලන්න)

1. විභාගයේ නම:
   ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියට බඳවාගැනීම සඳහා පවත්වන සීමිත තරඟ විභාගය
2. විභාගය පිළිබඳ විස්තර: සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | පැය 1 | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව | පැය 2 | 100 | 40 |

*සටහන:*

සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරඟ විභාගයක් වුවද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් 40%ක් වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% ක් වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් අපැහැදිළි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

3. විභාගය පවත්වන බලධරයා: විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.
4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි
5. විභාගය සඳහා විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කරගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව | රාජ්‍ය සේවයේ විවිධ පරිසරයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඇතිවිය හැකි ගැටලු එකක් හෝ කිහිපයක් සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/ සිද්ධීන් අපේක්ෂකයාට යොමු කර අපේක්ෂකයා සතු තොරතුරු හා සන්නිවේදනතාක්ෂණ දැනුම, නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසි වලට අදාළව රාජ්‍ය සේවයේ පරිචය ආශ්‍රයෙන් මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

6. මෙම රෙගුලාසි සහ විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.

## 8 වැනි උපලේඛනය

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය**
(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8.1 ඡේදය බලන්න)

1. විභාගයේ නම :
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය | පැය 01 | 100 | 40 |
| 2. මුදල් රෙගුලාසි | පැය 01 | 100 | 40 |

*සටහන:*

(අ) එක් එක් විෂය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාර වලදී පෙනී සිටීමට නිලධාරියාට හැකිවේ.

(ආ) අදාළ සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතු වේ. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතු වේ.

3. විභාගය පවත්වන බලධරයා :විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්කිරීම් බලධාරියා විසින් අනුමත කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.
4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.
5. විභාගය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති සංග්‍රහය සම්බන්ධයෙන් රජයේ නිලධාරියා සතු මූලික දැනුම පරීක්ෂා කිරීම මෙහි අපේක්ෂාව වේ. |
| 2. මුදල් රෙගුලාසි | රජයේ කාර්යාලවල භාවිතා වන මුදල් රෙගුලාසි පිළිබඳව මූලික දැනුම හා මුදල් පාලන පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය හා ගබඩාකරණය පිළිබඳ මූලික දැනුම මැනීම අපේක්ෂා කෙරේ. |

6. මෙම රෙගුලාසි හා විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින් වර ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.

## 9 වැනි උපලේඛනය

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8.1 ඡේදය බලන්න)

1. විභාගයේ නම :
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය | පැය 02 | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | පැය 03 | 100 | 40 |

*සටහන:*

*(අ)* එක් එක් විෂය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාර වලදී පෙනී සිටීමට නිළධාරියාට හැකිවේ.

*(ආ)* අදාළ සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් නිලධාරින් විසින් ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතු වේ. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතු වේ.

3. විභාගය පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්කිරීම් බලධාරියා විසින් අනුමත කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.
4. විභාගය පවත්වනු ලබන කාලසීමාව: වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.
5. විභාගය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය | රජයේ කාර්යාලයන්හි භාවිතා කෙරෙන කාර්යාල ක්‍රම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරික්ෂා කිරීම සහ ඒවා භාවිතා කිරීමේ හැකියාව පරික්ෂා කිරීමද අපේක්ෂා කෙරේ. |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | රජයේ කාර්යාලයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සාමාන්‍ය සංකල්ප සහ තොරතුරු තාක්ෂණය මනාසේ උපයෝගී කර ගැනීම පිළිබඳව දැනුම මෙමගින් පරික්ෂා කෙරේ.<br><br>රජයේ ආයතනයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා වන ආකාරය, පරිගණක ජාල සහ දත්ත සන්නිවේදනය පිළිබඳ මනා දැනුම, පොදු කාර්ය මෘදුකාංග පිළිබඳ දැනුම සහ විශේෂිත භාවිත මෘදුකාංග, දත්ත සුරැකුම් පිළිබඳ සහ මෘදුකාංගවල සුරක්ෂිත භාවය සහ පරිගණක පද්ධතිවල අඛණ්ඩ සේවාව ලබා ගැනීම හා දත්ත සුරක්ෂිත භාවය වර්ධනය සඳහා ගත හැකි මූලික ක්‍රියා මාර්ග.<br><br>ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.<br><br>ප්‍රශ්න පත්‍රය — කාලය — ලකුණු<br>I වැනි ප්‍රශ්න පත්‍රය - බහුවරණ ප්‍රශ්න — පැය 1 — 40<br>II වැනි ප්‍රශ්න පත්‍රය - රචනාමය ප්‍රශ්න — පැය 2 — 60<br>මුළු ලකුණු — 100 |

6. මෙම රෙගුලාසි හා විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැලකිල්ල යොමු කළ යුතුය.

## 10 වැනි උපලේඛනය

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8.1 ඡේදය බලන්න)

1. විභාගයේ නම :
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ නිලධාරීන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - ලිඛිත පරීක්ෂණය | පැය 01 | 50 | 20 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - ප්‍රායෝගික පරීක්ෂණය | පැය 01 | 50 | 20 |

*සටහන:*
අදාළ සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු සැපයිය යුතු වේ. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයිය යුතු වේ.

3. විභාගය පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්කිරීම් බලධාරියා විසින් අනුමත කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.
4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.
5. විභාගය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - ලිඛිත පරීක්ෂණය | (i) කාර්යාලීය කටයුතු සඳහා මෘදුකාංග භාවිතය හා ඒ පිළිබඳ දැනුම.<br>(ii) පරිගණක ජාල පිළිබඳ දැනුම.<br>(iii) පරිගණක මෘදුකාංගයන්හි/ දෘඩාංගයන්හි දෝෂ හඳුනාගැනීම සහ ඒවා නිරාකරණය කිරීම පිළිබඳ දැනුම. |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ - ප්‍රායෝගික පරීක්ෂණය | (i) කාර්යාලීය කටයුතු සඳහා මෘදුකාංග භාවිතයේ ප්‍රායෝගික දැනුම.<br>(ii) පරිගණක ජාල පිළිබඳ ප්‍රායෝගික දැනුම.<br>(iii) පරිගණක මෘදුකාංගයන්හි/ දෘඩාංගයන්හි දෝෂ හඳුනාගැනීම සහ ඒවා නිරාකරණය කිරීම පිළිබඳ ප්‍රායෝගික දැනුම. |

6. මෙම රෙගුලාසි හා විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.

## 11 වැනි උපලේඛනය

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8.1 ඡේදය බලන්න)

1. විභාගයේ නම :
 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය
2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40 |
| 2. මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40 |

සටහන:

(අ) එක් එක් විෂය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාර වලදී පෙනී සිටීමට නිලධාරියාට හැකිවේ.

(ආ) අදාළ සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතු වේ. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතු වේ.

3. විභාගය පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්කිරීම් බලධාරියා විසින් අනුමත කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.
4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.
5. විභාගය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ විධිවිධාන/ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සම්බන්ධයෙන් නිලධාරියා සතු සාමාන්‍ය දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ. ආයතන සංග්‍රහයෙහි I වැනි, II වැනි වෙළුමෙහි අඩංගු පරිච්ඡේද වලින් හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ. |
| 2. මුදල් රෙගුලාසි | රජයේ කාර්යාලවල භාවිතා වන මුදල් රෙගුලාසි පිළිබඳව දැනුම හා මුදල් පාලන පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය හා ගබඩාකරණය පිළිබඳ දැනුම මැනීම අපේක්ෂා කෙරේ. |

6. මෙම රෙගුලාසි හා විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.

## 12 වැනි උපලේඛනය

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8.1 ඡේදය බලන්න)

1. විභාගයේ නම
   ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය | පැය 02 | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හා ඉ - රාජ්‍ය | පැය 03 | 100 | 40 |

සටහන :

(අ) එක් එක් විෂය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාර වලදී පෙනී සිටීමට නිළධාරියාට හැකිවේ.

(ආ) අදාළ සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතු වේ. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතු වේ.

3. විභාගය පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්කිරීම් බලධාරියා විසින් අනුමත කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.

4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.

5. විභාගය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය | රජයේ කාර්යාලයන්හි භාවිතා කෙරෙන කාර්යාල ක්‍රම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සහ ඒවා භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීමද අපේක්ෂා කෙරේ. |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හා ඉ - රාජ්‍ය | මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.<br>ප්‍රශ්න පත්‍රය — කාලය — ලකුණු<br>I වැනි ප්‍රශ්න පත්‍රය - බහුවරණ ප්‍රශ්න — පැය 1 — 40<br>II වැනි ප්‍රශ්න පත්‍රය - රචනාමය ප්‍රශ්න — පැය 2 — 60<br>මුළු ලකුණු — 100<br>පහත විෂය ක්ෂේත්‍රය ආවරණය වන පරිදි ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.<br>(අ) තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ජීව චක්‍රයේ මූලික කොටස් වන ක්‍රම අධ්‍යයනය, පද්ධති විශ්ලේෂණය, පද්ධති නිර්මාණය, ඒ සඳහා මෘදුකාංග සංවර්ධනය, ඒවා පරීක්ෂාව, පරිශීලක භාර ගැනීම් පරීක්ෂාව, ආදියද ඒවාට අදාලවන තාක්ෂණික ක්ෂේත්‍ර වන ඇල්ගොරිදම්ස්, HTML, XTML, php, දත්ත හා තොරතුරු ආරක්ෂාව, ව්‍යසන හේතුවෙන් නැවත පද්ධති ස්ථාපනය, බුද්ධිමය දේපල හිමිකම හා මෘදුකාංග බලපත්‍ර, නිදහස් හා විවෘත මූලාශ්‍ර මෘදුකාංග, වෙබ් 2.0 ආදිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කොටසට ඇතුළත් වේ.<br>(ආ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය රාජ්‍ය අංශයට යොදාගැනීමේ ක්‍රමවේද, රාජ්‍ය සේවා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදාගෙන වඩා කාර්යක්ෂමව ඉටු කිරීම, ඉ- රාජ්‍ය ක්‍රම සඳහා මූලික තාක්ෂණික අවශ්‍යතා, රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපරි ව්‍යුහයක මූලික අංග, ඉ- රාජ්‍ය පද්ධතියක මූලික අංග, අන්තර් ක්‍රියාකාරී හැකියාව (Interoperability) ආදිය ඉ- රාජ්‍ය කොටසට අයත් වේ. |

6. මෙම රෙගුලාසි හා විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.

## 13 වැනි උපලේඛනය

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8.1 ඡේදය බලන්න)

1. විභාගයේ නම
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය හා පරිපාලනය | පැය 03 | 100 | 40 |
| 2. මුදල් රෙගුලාසි හා රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | පැය 03 | 100 | 40 |
| 3. කළමනාකරණය හා සංවිධානය | පැය 03 | 100 | 40 |

සටහන:

(අ) එක් එක් විෂය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාර වලදී පෙනී සිටීමට නිලධාරියාට හැකිවේ.

(ආ) අදාළ සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතු වේ. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතු වේ.

3. විභාගය පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පරිපාලන බලධාරියා විසින් අනුමත කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.
4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.
5. විභාගය සඳහා විෂය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. ආයතන සංග්‍රහය හා පරිපාලනය | පහත දැක්වෙන කරුණු මත පදනම් වන එක් ප්‍රශ්න පත්‍රයකි.<br>(i) කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම<br>(ii) ආයතන සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද I, II,III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII හා XLVIII<br>(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහය |
| 2. මුදල් රෙගුලාසි හා රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයකි.<br>(අ) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන, රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය, අරමුදල් යන්නෙහි අර්ථය, ඒකාබද්ධ අරමුදල සහ එහි ක්‍රියාකාරීත්වය, විසර්ජනයේ අරමුණු හා විසර්ජන ක්‍රම, අවිනිශ්චිත අවස්ථා අරමුදල, වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරීත්වය, රාජ්‍ය ආදායම, මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්ය භාරය, වොරන්ට් හා අග්‍රිම අධිකාරිය, විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්ය භාරය, රාජ්‍ය වියදම් කමිටුව, රාජ්‍ය ව්‍යාපාර කමිටුව.<br>(ආ) ගිණුම් නිලධාරීන්, ප්‍රධාන ගිණුම් නිලධාරීන් හා රාජ්‍ය ආදායම පිළිබඳ රාජ්‍ය ගිණුම් නිලධාරීන් පත්කිරීම, ඔවුන්ගේ බලතල හා කාර්යභාරය<br>(ඇ) අභ්‍යන්තර විගණනය<br>(ඈ) රාජ්‍ය වියදම් සැලසුම් කිරීම හා කළමනාකරණය, සංවිධානවල අරමුණු හා කාර්යභාරයන් හඳුනා ගැනීම, රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ, ඉලක්ක හා වැඩසටහන් හඳුනා ගැනීම, සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන් සැළසුම් කිරීම හා ඇගයීම් හා ප්‍රමුඛතාකරණය, වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම.<br>(ඉ) අනුමත වියදම් ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම, වීරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය, මුළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධනය කිරීම, පරිපූරක ඇස්තමේන්තු.<br>(ඊ) රජයේ දේපලවල පාඩු හා අත්හැරීම්<br>(උ) විවිධ ගිණුම් කටයුතු<br>(ඌ) මූල්‍ය කළමනාකරණය සඳහා කාර්ය භාරයන් පැවැරීම<br>(එ) රජයේ මුදල්වල භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය<br>(ඒ) රජයේ සැපයුම් ක්‍රියා පරිපාටිය, භාණ්ඩ, සේවා හා වැඩ ලබාගැනීම, ප්‍රසම්පාදන මණ්ඩල හා තාක්ෂණික ඇගයුම් කමිටුවල සංයුතිය, පත්කිරීම, බලතල හා කාර්ය භාරය, ප්‍රසම්පාදන ඇගයීමේ ක්‍රියාපරිපාටිය, විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල කළමනාකරණය. |
| 3. කළමනාකරණය හා සංවිධානය | පහත දැක්වෙන කරුණු මත පදනම් වන එක් ප්‍රශ්න පත්‍රයකි.<br>(අ) කළමනාකරණය හා සංවිධානය පිළිබඳ මූලධර්ම<br>(ආ) එම මූලධර්ම රාජ්‍ය අංශයේ පැන නගින ගැටළුවලට අදාල කර ගැනීම<br>(ඇ) කළමනාකරණය පිළිබඳ නූතන ක්‍රමවේදයන් හා ශිල්පක්‍රම |

6. මෙම රෙගුලාසි හා විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.

## 14 වැනි උපලේඛනය

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8.1 ඡේදය බලන්න)

1. විභාගයේ නම :
   ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. කාර්යාල කළමනාකරණය | පැය 01 | 100 | 40 |
| 2. ඉ - රාජ්‍ය සංකල්පය හා තොරතුරු තාක්ෂණ කළමනාකරණය<br>I වැනි ප්‍රශ්න පත්‍රය - බහුවරණ<br>II වැනි ප්‍රශ්න පත්‍රය - රචනාමය | <br>පැය 01<br>පැය 01 | <br>40<br>60 | <br>16<br>24 |

*සටහන:*

(අ) එක් එක් විෂය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාර වලදී පෙනී සිටීමට නිළධාරියාට හැකිවේ.

(ආ) අදාළ සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතු වේ. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතු වේ.

3. විභාගය පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පරිපාලන බලධාරියා විසින් අනුමත කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.

4. විභාගය පවත්වනු ලබන කාලසීමාව: වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.

5. විභාගය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. කාර්යාල කළමනාකරණය | රාජ්‍ය අංශයේ කාර්යාලවල මානව හා භෞතික සම්පත් කළමනාකරණය සම්බන්ධව දෙන ලද සිද්ධියක් පදනම් කර ගනිමින් පිළිතුරු සැපයීම. |
| 2. ඉ - රාජ්‍ය සංකල්පය හා තොරතුරු තාක්ෂණ කළමනාකරණය<br>I වැනි ප්‍රශ්න පත්‍රය - බහුවරණ | <br>ඉ - රාජ්‍ය ක්‍රමයේ විකාශනය, එහි අවධි, ඉ - රාජ්‍ය මූලික කොටස්, ඉ- සේවා හා ඉ-රාජ්‍ය ව්‍යාපෘති, රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපරිව්‍යුහය, ඉ- රාජ්‍ය සාර්ථක කර ගැනීමේ තීරණාත්මක සාධක, ඉ - රාජ්‍ය කළමනාකරණය, අන්තර් ක්‍රියාකාරී හැකියාව (Interoperability) හා සේවා අභිමුඛ නිර්මිතිය (Service Oriented Architecture) ඉ- රාජ්‍ය සංකල්පවලට ඇතුළත් වේ. |
| II වැනි ප්‍රශ්න පත්‍රය - රචනාමය | තොරතුරු තාක්ෂණ ජීව චක්‍රය, එහි එක් එක් අවස්ථාවල වැදගත්කම හා ඒ සඳහා අවශ්‍ය සම්පත්වල විශේෂතා, තොරතුරු තාක්ෂණ කළමනාකරණයේ මූලික සිද්ධාන්ත, තොරතුරු තාක්ෂණ සම්පත් කළමනාකරණය, තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතිවල අවදානම් සහ ඒවා අවම කර ගැනීම තොරතුරු තාක්ෂණ කළමනාකරණයට ඇතුළත් වේ. |

6. මෙම රෙගුලාසි හා විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.

## 15 වැනි උපලේඛනය

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

(මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 8.1 ඡේදය බලන්න)

1. විභාගයේ නම ෘ
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ නිලධාරීන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර ෘ

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතිය<br>I. ව්‍යාපෘති වාර්තාව | - | 60 | 30 |
| II. ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කිරීම. | පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම හා පිළිතුරු සැපයීම සඳහා කාලය මිනිත්තු 30 | 40 | 20 |

3. විභාගය පවත්වන බලධරයාඃ පරිපාලන බලධරයා විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලැබේ.
4. විභාගය පවත්වනු ලබන කාලසීමාව ෘ වර්ෂයකට දෙවරක් පවත්වනු ලැබේ.

5. විභාගය සඳහා විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතිය<br>I. ව්‍යාපෘති වාර්තාව | ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ කාර්යාලයන්හි ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා ප්‍රායෝගිකව යොදා ගත හැකි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය ක්ෂේත්‍රයට අදාල වචන පහලොස් දහසකට (15,000) නොඅඩු ව්‍යාපෘති වාර්තාවක් සැකසීම. |
| II. ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කිරීම. | පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම හා පරීක්ෂණ මණ්ඩලය විසින් විමසා සිටින ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම. |

6. මෙම රෙගුලාසි හා විධිවිධාන අවශ්‍යතාවය අනුව සංශෝධනය කළ හැක. විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තර සහ විභාග විෂය නිර්දේශ පත්‍රය ගැන දැන ගැනීම සඳහා වරින්වර ප්‍රසිද්ධ කරන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන් සැළකිල්ල යොමු කළ යුතුය.

01 - 349

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.